# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 8 දරන
# රියොඉච් සසකාවා සංස්කෘතික, සෞඛ්‍යසේවා සහ අධ්‍යාපනික සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සභාගතකය සටහන් කළේ 1932 පෙබරවාරි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1992 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 60 යි.

තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1992 අංක 8 දරන රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍යසේවා සහ අධ්‍යාපනික සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

**එල්. ඩී.—ඕ. 81/90**

**රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

“රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී ආයතනයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායි ලෙස කර ගෙන යාම සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද :

එකී ආයතනය සංස්ථාගත කරන මෙන් එය විසින් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 8 දරන රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනමෙහි සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ‘සංස්ථාව’ යනුවෙන් සඳහන් කරනු ලබන) “රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නමින් සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද නඩු පැවරිය හැකි වන්නේ ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ අරමුණු.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජපානයේ ගරු රියොඉචි සසකාවා ප්‍රතිපත්ති ප්‍රචාරයට පත් කිරීම ;

(ආ) ලෝකයේ වෙසෙන සෑම ජන කොටසක්ම අතර ජාත්‍යන්තර සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) වාර්ගික, ආගමික සහ ගෝත්‍රික එකමුතුව ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය දීම. සහ සමාජමය අශක්තතා දුරු කිරීම සඳහා කටයුතු කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම සහ ලෝක ජනතාව අතර සාමය සහ එකමුතුකම වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා පාසල් සහ අධ්‍යාපනික ආයතන, විද්‍යාල ආදිය පිහිටුවීම, පවත්වාගෙන යාම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හා ලංකාවේ හා පිටරට සිටින සුදුසු ශිෂ්‍යයන්ට ණය, ප්‍රදාන, ශිෂ්‍යත්ව සහ වෙනත් තෑගි ආදිය ලබාදීම සහ වෙනත් කටයුතු සැලසීම ;

(ඊ) ආධ්‍යාත්මික, දාර්ශනික, සංස්කෘතික හා ආගමික අධ්‍යාපන යට ධෛර්ය දීම සහ මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් සේවය කිරීමට කැප වූ ජීවිතයක් ගත කිරීම සඳහා සහ ගරු රියොඉචි සසකාවාගේ ඉගැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යයන් සහ වෙනත් තැනැත්තන් පුහුණු කිරීම ;

(උ) ගරු රියොඉචි සසකාවාගේ ඉගැන්වීම් ප්‍රචාරය කිරීමෙහි නියුක්තව සිටින තැනැත්තන්ට මූල්‍ය සහ වෙනත් ආධාර සැපයීම ;

(ඌ) ළමා උයන්, ක්‍රීඩා භූමි, ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන, අධ්‍යාපනික නිවාස, සායන, ආරෝග්‍යශාලා, රෝග නිශ්චය කිරීමේ මධ්‍යස්ථාන, ප්‍රජා ශාලා ඉදිකිරීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සහ නැති බැරි තැනැත්තන් සඳහා කවර ආකාරයක වුවද වෛද්‍ය සහන සහ ආධාර සැපයීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩ මුළු, පන්ති විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් ක්‍රියාකාරකම් පිළියෙල කිරීම, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා පුස්තකාල, වෙනත් සේවා සැපයීම සහ පොත්, වාර සඟරා, සිඟිවටින, ප්‍රකාශන, සඟරා සහ පුවත්පත් මුද්‍රණය කිරීමට, පළ කිරීමට සහ විකිණීමට සහායවීම ;

(ඔ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පවත්වනු ලබන ආගමික, දාර්ශනික හෝ සාම සම්මේලන වලට නියෝජිතයන් යැවීම ;

(ඕ) ගස් වැවීමට සහ පරිසරය ආරක්ෂා කිරීමට ජනතාව ධෛර්යමත් කිරීම ;

(ක) ජපානයේ සහ වෙනත් රටවල සිටින ගරු රියොඉචි සසකාවා අනුගාමිකයන් සමග අදහස් හුවමාරු කර ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම, ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ග) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :— සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වියහැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම;

(ආ) යම් තැනැත්තකුගෙන් හෝ සංස්ථාගත වූ හෝ නොඑසේ වූ පුද්ගල මණ්ඩලයකින් හෝ යම් ආණ්ඩුවකින්, විදේශීය රටකින් හෝ ද්‍රව්‍ය වලින් වූ යම් ආධාරයක්, ප්‍රදානයක් හෝ ත්‍යාගයක් ලබාගැනීම හෝ එකතු කිරීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ කිසිවක් හෝ සියල්ල හෝ වැඩිදුරටත් ඉටුකර ගැනීමේ කාර්යය සඳහා විදේශීය රටවල සංස්ථාවේ ශාඛා සංවිධාන පිහිටුවීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම සහ එසේ ණයට ගන්නා ලද හෝ ලබාගන්නා ලද ඒ මුදල් ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා උකස්කර හෝ බැඳුම්කර ලියා අත්සන් කිරීම;

(ඉ) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සිදුකිරීම හා ඉටුකිරීම සඳහා ද සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා ද අවශ්‍ය සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙලින්ම හෝ සංස්ථාව විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ එහි නිලධරයන්, සේවකයන් හෝ නියෝජිත යන් මගින් එළඹීම හෝ ගිවිසුම් ඉටු කිරීම;

(ඊ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මේ පනතෙහි 3 වන වගන්තියෙහි දක්වා ඇති අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

5. (1) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධාන වලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා පූජ්‍ය පැල්පොල විපස්සී ස්වාමීන් වහන්සේ විය යුතු අතර උන්වහන්සේ යාවජීවව එකී ධුරය දැරිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.**

6. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, මුදල් පිළිබඳ නියාදනයකින් හෝ අන් ලෙසකින් සංස්ථාව සතු වන කවර වූවද චංචල හෝ නිශ්චල දේපළක් මේ පනතේ විධිවිධානවලට යටත්ව භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශක්‍යතාව තිබෙන අතර, එබඳු සියලු දේපළ තත්කාලයෙහි සංස්ථාවේ බලාත්මකව පවතින රීතිවලට යටත්ව, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ රීති.**

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, හෝ ඔවුන් නෙරපීම සඳහා, නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ ඒ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා, සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ධුරයේ පුරප්පාඩුවක් වුවහොත් එය පිරවීම සඳහා, අවශ්‍ය වන්නා වූ, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන්නා වූ රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීම කදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේය. ඒ රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතුය. මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන්, සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංගමයට ලැබිය යුතු සහ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු ණය.**

8. මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී රියෝ ඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා පදනම විසින් ගෙවනු ලැබිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ දිනයෙහි එකී පදනම වෙත ගෙවනු ලැබිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

## 1992 අංක 8 දරන රියොඉචි සසකාවා සංස්කෘතික, සෞඛ්‍යසේවා සහ අධ්‍යාපනික සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ භාරයෙහි තිබිය යුතු අතර, එය ඒ අධ්‍යක්ෂ ජනරාල් සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතුය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කල යුතු අතර, එම අත්සන්කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. මේ පනතෙහි සදහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

[illegible] සිංහල පත්‍ර කොටස්වල හා පත්‍රවල මාර්ගික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා [illegible] [illegible].